# පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ අවධානය යොමුකල යුතු කරුණු (මෙය මගපෙන්වීමක් පමණි. නීතිමය ලියවිල්ලක් නොවේ.)

## 1. පළාත් පාලන ආයතන සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැකි අපේක්ෂකයන්

1. මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්
2. ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් (තනි පුද්ගලයෙකුට ඉදිරිපත් විය නොහැක)

## 2. නාමයෝජනා කාලසීමාව

1. මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි තේරීම් භාර නිලධාරීන් විසින් නාම යෝජනා කාල සීමාව ප්‍රකාශයට පත්කළ දිනයේ සිට දින 14 වන දිනයෙන් ආරම්භ වන නාම යෝජනා කාලසීමාව එකී දැන්වීම නිකුත් කළ දිනයේ සිට 17 වන දින මධ්‍යහන 12.00ට අවසන් වේ.

**3. නාම යෝජනා භාර දීමට අදාළව ඒ ඒ පළාත් පාලන ආයතනයට පළමු ලැයිස්තුවෙන් (එක් එක් කොට්ඨාස සඳහා තරග කරන අපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුව) හා දෙවන ලැයිස්තුවෙන් (කොට්ඨාස වලින් තේරී පත් වූ සභිකයන්ට අතිරේකව පත් කළ යුතු සභිකයන් තෝරා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලැයිස්තුව) නම් කළ යුතු අපේක්ෂක ප්‍රමාණය, කාන්තා අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යාව , සෑම පළාත් පාලන ආයතන සඳහා ම තරග කළ යුතු 25% ක් වූ තරුණ අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව, තරග කරන අපේක්ෂකයන් වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් ඒ ඒ පළාත් පාලන ආයතන අනුව තැන්පත් කළ යුතු ඇප තැන්පත් ප්‍රමාණය ඇතුළු සියලු විස්තර මැතිවරණ කොමිසම විසින් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. (28(2අ) වගන්තිය)**

1. දේශපාලන පක්ෂයක් නම් එක් අයෙකුට රුපියල් 1500 ක්ද
2. ස්වාධීන කණ්ඩායමක් නම් එක් අයෙකුට රුපියල් 5000 ක්ද

වශයෙන් නාමයෝජනා ලබාදෙන අවසන් දිනට පෙර දින දහවල් 12.00 ට පෙර ඇප මුදල් තැන්පත් කර අවසන් කළ යුතු ය.

## 4. නාමයෝජනා ලබාදීමට අවශ්‍ය මූලික සුදුසුකම්

1. එකී ඡන්ද විමසීමට අදාළ වලංගු නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී අවුරුදු 18 (දහ අට)සම්පූර්ණ කර තිබීම

2. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

3. ඡන්ද විමසීම සිදුකරන (ඡන්දය ඉල්ලීමට අපේක්ෂා කරන) පළාත් පාලන බල ප්‍රදේශයේ ඡන්දදායකයෙකු ලෙස ලියාපදිංචියට සුදුසු පුරවැසියෙකු වීම (ලියාපදිංචිවී තිබීම අනිවාර්ය නොවේ) අදාළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ සාමාන්‍ය පදිංචිකරුවකු විය යුතු ය.

## 5. නාමයෝජනා ලබාදීමේදී සැලකිය යුතු තාක්ෂණික කරුණු

1. නාම යෝජනා පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර පක්ෂයේ / කණ්ඩායමේ අපේක්ෂක ලැයිස්තු වලට අදාල ඇප මුදල් තැන්පත් කිරීම (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ආඥා පනතේ 29 වන වගන්තිය)

2. නාම යෝජනා කාලසීමාව තුළ කොට්ඨාශ ලැයිස්තුව (පළමු ලැයිස්තුව) හා අමතර ලැයිස්තුව (දෙවන ලැයිස්තුව) යන දෙකම එක ලේඛනයක් සේ සකස් කර දේශපාලන පක්ෂයක් නම් එම පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් ද ස්වාධීන කණ්ඩායමක් නම් ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් ද භාර දීම (28(5) වන වගන්තිය)

3. එහිදී එක් කොට්ඨාසයට එක් අයකු බැගින් හෝ බහු කොට්ඨාසයක් නම් එම කොට්ඨාසයෙන් තේරී පත් වන සභිකයන්ගේ ප්‍රමාණයට සමාන අපේක්ෂකයන් බැගින් ද ඇතුළත් කර පළමු වන ලැයිස්තුව සකස් කළ යුතු ය. එම සංඛ්‍යාව මුළු සභික සම්‍යා වෙන් 60% විය යුතු ය. (28(2)(අ) වගන්තිය)

දෙවන ලැයිස්තුව සකස් කිරිමේදී මුළු සභික සංඛ්‍යාවෙන් සියයට 40% වන සංඛ්‍යාවට තව අපේක්ෂකයන් තිදෙනෙක් එකතු කර ලැබෙන සංඛ්‍යාව ඇතුළත් කළ යුතු ය.(28(2)(ආ) වගන්තිය)

4. කාන්තා කෝටාව තහවුරු කිරීම සඳහා අදාල කොට්ඨාස ලැයිස්තුවෙන් තරග කරන අපේක්ෂකයන්ගෙන් (පළවන ලැයිස්තුව) 10% ක් කාන්තාවන් විය යුතු ය.(28(2අ)(ආ)වගන්තිය)

5. දෙවන ලැයිස්තුව සඳහා එම ලැයිස්තුවට ඇතුළත් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාවෙන් 50% කාන්තාවන් විය යුතු ය.(28(2අ)(ආ)වගන්තිය)

6. තරුණ නියෝජනය තහවුරු කිරීම සඳහා පළවන ලැයිස්තුවෙන් හෝ දෙවන ලැයිස්තුවෙන් හෝ දෙකෙන්ම 25% ක ප්‍රතිශතයක් තරුණ තරුණියන් ඇතුළත් කළ යුතුය. (එහිදී තරුණ තරුණයන් සම සමව සිටීම අවශ්‍ය නොවේ) (28(2අ)(අ) වගන්තිය)

7. අපේක්ෂකයන් සියලු දෙනා විසින් සිය කැමැත්ත දැක්වීම සඳහා අදාළ නාම යෝජනා පත්‍රයේ අත්සන් කිරීම (28(4) වගන්තිය)

8. සෑම අපේක්ෂකයෙකු විසින් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත් වන උප ලේඛනයේ සඳහන් දිවුරුම විධිමත් ව අත්සන් කර සහතික කර භාර දීම (28(4) වගන්තිය)

9. දේශපාලන පක්ෂයක් නම් පක්ෂ ලේකම් විසින් ද ස්වාධීන කණ්ඩායමක් නම් එම කණ්ඩායමේ නායකයා විසින් ද නාම යෝජනා පත්‍රයේ අත්සන් කර තිබීම හා එම අත්සන සාමදාන විනිශ්චයකාර වරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් විධිමත්ව සහතික කර තිබීම (28(5) වගන්තිය)

10. තරුණ අපේක්ෂකයන්ගේ හෝ අපේක්ෂිකාවන්ගේ වයස වලංගු නාමලේඛනයේ ප්‍රතිශෝධනය ආරම්භ කළ වර්ෂයේ පෙබරවාරි 01 වෙනි දිනට (මෙම මැතිවරණයට අදාළව 2024 පෙබරවාරි 01 දිනට) වයස අවුරුදු 18 ට අඩු නොවූ සහ නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයට වයස අවුරුදු 35 ට (මෙම මැතිවරණයට අදාළව 2025 මාර්තු මස 20 දිනට) නොවැඩි බව සනාථ කිරීම සඳහා අදාළ අපේක්ෂකයාගේ හෝ අපේක්ෂිකාවගේ උප්පැන්න සහතිකය හෝ ඔහු/ ඇය විසින් උපන්දිනය සනාථ කර ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් හෝ අමුණා තිබීම (28(4අ) වගන්තිය සහ 89 වගන්තිය)

## 6. නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් සියලුම අපේක්ෂකයන්ගේ නාම යෝජනා ප්‍රතික්ෂේප වීමට බලපාන කරුණු

1. නියමිත ඇප මුදල් තැන්පත් නොකිරීම (31(1)(ඇ) වගන්තිය)

2. නාම යෝජනා කාලය තුළ නාම යෝජනා පත්‍ර භාරදීමට අපොහොසත් වීම (31(1)(අ) වගන්තිය)

3. දේශපාලන පක්ෂයක් නම්, පක්ෂ ලේකම් හෝ බලයලත් නියෝජිතයා නාම යෝජනා පත්‍රය භාර නො දීම (31(1)(අ) වගන්තිය)

4. ස්වාධීන කණ්ඩායමක නම් කණ්ඩායම් නායකයා නාම යෝජනා පත්‍රය භාර නො දීම (31(1)(අ) වගන්තිය)

5. පළමු නාමයෝජනා පත්‍රයේ කාන්තා නියෝජනය 10% ක අවම සංඛ්‍යාව ඇතුළත් නො කිරීම (31(1)(ඊ) වගන්තිය)

6. දෙවන නාම යෝජනා පත්‍රයේ කාන්තා නියෝජනය 50% අවම සීමාව ඇතුලත් නො කිරීම(31(1)(ඊ) වගන්තිය)

7. තරුණ නියෝජනය 25% අවම සංඛ්‍යාව පළමු ලැයිස්තුවෙන් හෝ දෙවන ලැයිස්තුවෙන් හෝ දෙකෙන්ම ආවරණය නොවීම (31(1)(ඊ) වගන්තිය)

8. පක්ෂ ලේකම්ගේ හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා නාමයෝජනා පත්‍රයේ අත්සන් නොකිරීම හා එම අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් විධිමත්ව සහතික නො කිරීම (31(1)(අ) වගන්තිය)

## 7. අදාල අපේක්ෂකයා පමණක් ප්‍රතික්ෂේප වීමට බලපාන කරුණු

1.අදාළ අපේක්ෂකයා තරුණයෙකු වන අවස්ථාවක තම උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් හෝ උප්පැන්න සහතිකය ඉදිරිපත් නො කිරීම හෝ තම උපන් දිනය සහතික කරමින් අත්සන් කළ දිවුරුම් ප්‍රකාශයක් හෝ එකී නාම යෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හැරීම. (31(3)(අ) වගන්තිය)

2.අදාළ අපේක්ෂකයා විසින් සිය ලිඛිත කැමැත්ත නාමයෝජනා පත්‍රය මත අත්සන් කිරීම මගින් සනාථ නො කිරීම (31(3)(ආ) වගන්තිය)

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත් වන උපලේඛනයේ සඳහන් දිවුරුම හෝ ප්‍රතිඥාව අත්සන් කර විධිමත්ව සහතික කර ඉදිරිපත් නො කිරීම හෝ ඉදිරිපත් කරන ලද දිවුරුම හෝ ප්‍රතිඥාව ප්‍රතික්ෂේප වීම (31(3)(ආ) වගන්තිය)

මෙසේ ප්‍රතික්ෂේප කරන ලද අපේක්ෂකයා හෝ අපේක්ෂිකා තරුණයෙක් හෝ කාන්තාවක් වූ අවස්ථාවක එම ප්‍රතික්ෂේප වීම හේතුවෙන් පනතේ සඳහන් අවම තරුණ හෝ කාන්තා අපේක්ෂක සංඛ්‍යාව අඩු වෙන්නේ නම් අවස්ථාවෝචිත පරිදි තරුණ හෝ කාන්තා අපේක්ෂකයන්ගෙන් අවම සංඛ්‍යාව ඇතුළත් නොවීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි තේරීම් භාර නිලධාරීන් විසින් එම නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් සියලුම අපේක්ෂකයන් ප්‍රතික්ෂේප විය හැකිය.

## 8. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ආඥා පනත යටතේ තෝරා පත් කර ගැනීමට හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක් වශයෙන් අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ නුසුදුස්සෙකු වන අවස්ථා අතරින් කීපයක්. (මෙම නුසුදුසුකම් කිසිසේත්ම නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට අදාළ නොවේ.) (9 වන වගන්තිය)

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවීම

2. වයස අවුරුදු දහ අට සම්පූර්ණ නොවීම

3. අධිකරණ නිලධරයකු හෝ සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු හෝ ග්‍රාම නිලධාරි වැනි සාම නිලධරයකු හෝ වීම

4. ඡන්ද විමසීම් දිනයට අවම වශයෙන් අවුරුද්දකට පෙර හෝ එකී පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සිය සේවය අවසන් කර නොමැති ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නිරත වන රජයේ නිලධරයකු වීම

5. රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක එසේ නොමැති නම් රාජ්‍ය සංස්ථාවක මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු දරන තැනැත්තෙකු වීම

6. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටවන ලද පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වීම

7. අදාළ පළාත් පාලන ආයතනය විසින් සේවයෙහි යොදවනු ලැබ ඒ ආයතනයෙන් වේතනයක් ලබන ඒ ආයතනයේ නිලධරයකු හෝ සේවකයෙකු වුවහොත් හෝ ඒ ආයතනය විසින් සේවයෙහි යොදවා ගෙන සිටීම, එකී ඡන්ද විමසීම පවත්වන දිනයට පෙර අවුරුද්දක කාලය ඇතුළත, අවසන් කරනු ලැබූ තැනැත්තකු වීම

8. එම පළාත් පාලන ආයතනය සඳහා හෝ වෙනුවෙන් යම් තැනැත්තකු සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම

9. සිහි විකලව සිටින බව ශ්‍රී ලංකාවේ බලපවත්වා යම් නීතියක් යටතේ තීරණය කිරීම හෝ ප්‍රකාශ කිරීම

10. සහතික නොලත් හෝ නිදහස් නොවූ භංගත්වයට පත් කෙනෙකු වීම හෝ බුන්වතකු හෝ වීම

11. මාස දොළහකට වැඩි කාලයකට බන්ධනාගාර ගත වීමේ වරදකට වරදකරු වී එම දඬුවම විඳිමින් සිටින හෝ පෙරාතුම වූ අවුරුදු හතක කාලයක් තුළ එවැනි බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් සම්පූර්ණ කළ හෝ මරණ දඬුවමකට යටත්ව සිටින හෝ මරණ දඬුවම වෙනුවට ප්‍රදානය කරන ලද බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ පෙරාතුම වූ අවුරුදු හතක කාලය තුළ එවැනි දඬුවමක් සම්පූර්ණ කළ කෙනෙකු වීම

12. අපරාධ වැළැක්වීමේ ආඥා පනතේ අර්ථානුකූල යම් අපරාධයකට වරදකරු කරනු ලැබ මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් විඳිමින් සිටින හෝ පෙරාතුවම වූ පස් අවුරුදු කාල සීමාව තුළ විඳ අවසන් කොට තිබීම

13. එකම ඡන්ද විමසීම සඳහා එක් නාමයෝජනා පත්‍රයකට වැඩි ගණනක අපේක්ෂකයෙකු ලෙස නම ඇතුළත් කර තිබීම

14. අධිකරණ ක්‍රියා මාර්ගයකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුස්සෙකු බව තීරණය කර තිබීම

**9. ජයග්‍රහණයෙන් පසුව අභියෝගයට ලක්විය හැකි අවස්ථා**

1. ආදායම් වියදම් වාර්තා භාර නොදීම, වැරදි තොරතුරු දීම, ආධාර ලබාගත නොහැකි අයගෙන් ආධාර ලබා ගැනීම, වියදම් සීමාව ඉක්මවා යාම

2. අල්ලස් ලබාදුන් බවට අධිකරණය ඉදිරියේ ඔප්පු වීම

3. අපේක්ෂකයන් පළාත් පාලන බලප්‍රදේශයෙන් බැහැර බව ඔප්පු වීම

4. තරඟ කිරීමට නුසුදුසුකමක් සහිතව තරඟ කිරීම (රාජ්‍ය නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්ට, සභා නිලධාරීන්ට අදාළව හෝ වෙනත්)

**රෝහණ හෙට්ටිආරච්චි**

**විධායක අධ්‍යක්ෂ**

**පැෆ්රල්**